පොල්පිතිගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 සැප්තැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2012 දෙසැම්බර් මාසය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජූනි මස ලද රු.1,214,500 ක උසාවි දඩ ආදායම් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම් හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. නොවැම්බර් හා දෙසැම්බර් මාස වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම්ද හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.1,497,424 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම ජ'නල් සටහන් අංක 37 මගින් රු.1,208,475 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් රු.288,949 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). සභාව වෙත පරිත්‍යාග ලෙස ලද රු.1,479,000 ක් වූ ට්‍රැක්ටර් රථයේ වටිනාකම ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ). දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වෙනුවෙන් 2013 ජූනි මස ගෙවූ රු.134,643 ක් වූ ණය හා පොලී වාරික මුදල පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් (506) ගිණුමට හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු (504) යන වියදම් ගිණුමට යන ගිණුම් දෙකටම හර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.134,643 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු යටතේ ගිණුම් ගතකර තිබුණ රු.84,967 ක් වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් ලෙසද ගිණුම් ගතකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ණය හිමියන් රු.84,967 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂය අවසානයට රු.27,579,375 ක් වූ කර්මාන්ත ණයගැති වටිනාකම ජ'නල් සටහන් අංක 55 මගින් ණයගැතියන් ලෙස රු.26,295,358 ක් ගිණුම් ගතකිරිම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් රු.1,284,017 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ). 2012 පළාත් නිශ්චිත හා මහාමාර්ග අමාත්‍යාංශ ආධාර යටතේ වූ කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණ රු.14,993,938 ක සමුච්චිත අරමුදලට බැර කිරීම වෙනුවට ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය යටතේ ගිණුම් විෂයයන් දෙකක ගිණුම අනුව හා අදාල ලේඛන අනුව වූ අනුරූපී අගයන් අතර රු. 1,890,690 ක නොසැසඳීම් පැවතුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගිණුම් අතර මාරු ලෙස රු.3,044,376 ක අවිනිශ්චිත ස්වභාවයේ හර ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,485,897 ක් වූ අතර, 1,357,675 ක්ව වසර 1 ත් 3 ත් අතර කාලයකට අදාල විය.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.37,099,702 ක් වූ අතර, එයින් රු.3,547,395 ක්ම වසර 3 කට වැඩි කාලයකට අදාල විය.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 2,122,758 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරික්ෂාවක් කළ නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,381,107 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,687,818 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,306,711 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.83,385,023 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.58,559,695 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.26,206,435 ක් දක්වා වැඩිවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.33,723,349 න් සියයට 80 ක්වූ රු.27,075,426 ක් උත්පාදිත ආදායම් නොවන ලැබීම් වලින් සමන්විත විය. රු.83,385,022 ක් වූ මුළු ප්‍රාග්ධන ආදායම වෙනත් ආයතන මගින් බලප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.32,342,245 න් සියයට 67 ක් වූ රු.21,609,215 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 85 ක් වූ රු.18,305,740 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. ප්‍රාග්ධන වියදම වූ රු.58,559,695 න් සියයට 1 ක් ලෙස රු.599,874 ක් පමණක් සභා අරමුදල් වලින් වැයකර තිබුණි. ඉතිරි සියයට 99 ක් වූ රු.57,959,821 ක ප්‍රමාණය වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 33 අනුව නිශ්චිත කාලයට පැවරුන වරෙන්තුවක් මත වරිපනම් බදු හා අක්කර බදු ක්ෂේත්‍රයේදී අයකල හැකි අතර, ඊට අමතරව වෙළඳ බලපත්‍ර හා කඩකුලී ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ හෝ රීති මාලාව අනුව ලැබී ඇති නිශ්චිත බලය පැවරීමක් සිදුකල හැකි අවස්ථා හඳුනාගත නොහැකි විය

#### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.330,750 ක් විය.

2.3.3 වෙනත් ආදායම්

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව සභා බල ප්‍රදේශය තුල ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් හෝ ආපනශාලා වලින් පිරිවැටුම මත සියයට 1 ක් නොඉක්මවන ගාස්තුවක් අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට අනුමතව පැවති දුරකථන සම්ප්‍රේෂණ කුළුණෙන් පෙරසැරි ගාස්තු අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල රු.380,000 ක පිරිවැයක් මත ඉටුකිරීමට සැලසුම් කර තිබූ සුභසාධන කාර්යයන් 05 ක් ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). ඉඩම් කට්ටි කිරීම් වලට අදාලව සභාව විසින් ලේඛනයක් හෝ ලිපිගොනු නඩත්තු කිරීමක් සිදුව නොතිබුණි. 2011 අගෝස්තු 25 මඩගල්ල ඉඩමක් කට්ටි කිරීම සඳහා රු.25,000 ක් සභාවට ලැබී තිබූ අතර, එය විගණිත දිනය වන විටද මිශ්‍ර තැන්පතු යටතේ දක්වා තිබුණි. ඉඩම් කට්ටි කිරීමට අදාල තොරතුරද විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ). සභාව විසින් 2010 - 2013 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 191 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 176 ක් විය. එසේම ගොඩනැගිලි බලපත්‍රය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව හෝ අනුකූලතා සහතික නොමැතිව එම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට එරෙහිව හෝ සභාව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබු අතර, අනුකූලතා සහතික ගාස්තු හා ප්‍රමාද ගාස්තු අයකිරීම පිළිබඳව විධිවිධානද සභාව විසින් ඇතිකරගෙන නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව සභාව විසින් කුලියට ගෙන තිබූ වෑන් රථයක් සඳහා සමාලෝචිත වර්ෂයේ මාස 4 ක කාලයක් සඳහා ඉන්ධන වියදම් ලෙස රු.222,887 ක්ද කුලී වියදම් ලෙස රු.264,000 ක්ද සභාව විසින් දරා තිබූ අතර වාහනයේ රියදුරු ලෙස සභාවේ රියදුරෙකු කටයුතු කර තිබුණි.

3.4 නිශ්ක්‍රීය වත්කම්

වටිනාකම රු.150,000 ක් වූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය තුල නිශ්ක්‍රීයව පැවතුණි.

04. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පාලනය